

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **58 වන කාණ්ඩය** | **බු.ව. 2559 උඳුවප් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2015 දෙසැම්බර් මස 24 වන ද** | **08 වන කලබ** |

# ඔබ මැ යි මහා ගුරු දෙව් !

(අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමිපාණන් ගේ
101 වන උපන් දිනය වෙනුවෙන් ආසිරි පිණිස)

සිහිල් සෙවණ සැදු සසරේ ගිම් නිවන
දහම් වනස්පති රුක ඔබ වෙති සොබන
සුත පෙම් අදර පා සනහා මවු පෙමින
ඔබ මැ යි මහා ගුරු දෙව් අප ලද කලණ

නො සොයා තමන් සුව අනුනට සුවය සදා
නො බලා වෙහෙස සසුනට මුළු දිරිය පුදා
කළ තුඟු මෙහෙය කෙලෙසක මිනියැකි ද මෙදා
අපි සිහි කරමු ගුරු දෙව් ගුණ බැතිනි සදා

**- අනඳ**



# මහා බෝධිසත්ත්ව ආදර්ශය

ශ්‍රී ධර්මරක්ෂිත වංශාලංකාර මහෝපාධ්‍ය අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමිපාණන් වහන්සේ විසිනි.

මහ ජනක වැ පවර - නැසුණු තුරු දැක පල බර
සපිරි රජ සිරි හැර - ගොසින් වන මැද කෙළේ තවසර

උතුම් වූ මහා ජනක රජ තෙමේ නැසුණා වූ ඵල හරිත ගසක් දැක රජ සිරි සම්පත් හැර ගොසින් වනයට වැද තපස් රැක්කේය යනු මෙහි තේරුමයි.

මෙය මහ බෝසතුන් හසළ මඟෙකි. බුදුබවෙහි ඇලුණු උතුමා මහබෝසත් නමි. සම්‍යක් සම්බෝධිය පතමින් දස පාරමිතාවන්, පංච මහා පරිත්‍යාග, සතර බ්‍රහ්ම විහාර, සතර සංග්‍රහ වස්තු හා ත්‍රිවිධ චර්යා දීර්ඝ කාලාභ්‍යාස, නෛරන්තර්‍ය්‍යාභ්‍යාස, සාකල්‍යාභ්‍යාස, සත්කෘත්‍යාභ්‍යාස වශයෙන් සතර ආකාරයෙන් පුරුදු කළ උතුමාණන් වහන්සේ නම් අප මහ බෝසතාණන් වහන්සේ ය.

උන් වහන්සේ නො මිනිය හැකි, නො ගිණිය හැකි, කාලයක් මුළුල්ලේ හැම අගුණයක් ම මඬිමින් හැම සුගුණයක් ම වඩමින් අන්තිම ජාතියේ දී පුණ්‍ය පිණ්ඩයක් හෙවත් පින් පිඬක් බවට පත් වූහඃ මෛත්‍රී මූර්තියක් වූහඃ සමන්තභද්‍ර වූ සේක. සියලු බුදුකුරු දහම්

පුරුදු කළ සේක් කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් හෙවත් ප්‍රඥාවෙනි. "**කරුණා මහාබෝධියා මූලං**" යි ධර්මයෙහි සඳහන් පරිදි ලොවුතුරා බුදුබවට මුල කරුණාව යි.

"**නෙක්ඛම්මජ්ඣාසයා හි බෝධිසත්තා හොන්ති**" යි චරියා පිටකට්ඨකථායෙහි සඳහන් පරිදි කාමයෙහි හා ගිහිගෙයි දෙස් දක්නාසුලු බෝධිසත්වවරු නෛෂ්ක්‍රම්‍ය අදහස් ඇත්තෝ ය. ගිහිගෙන් හෙවත් පංචකාම වස්තූන්ගෙන් නික්මීමක් වන හෙයින් පැවිද්ද ද, පංචනීවරණයන්ගෙන් නික්මීමක් වන හෙයින් ප්‍රථම ධ්‍යානය ද, ක්ලේශයන්ගෙන් නික්මීමක් වන හෙයින් විදර්ශනාව ද, සසරින් නික්මීමක් වන හෙයින් නිවන ද, අකුසලයන්ගෙන් නික්මීමක් වන හෙයින් සියලු ම කුසල ධර්මයෝ ද නෛෂ්ක්‍රම්‍ය නාමයෙන් කියැවෙති. එහෙත් මෙතැන දී පස් කම් සැපතින් වෙන්වීම වූ පැවිද්ද ම නෛෂ්ක්‍රම්‍ය නම් වේ. මිල මුදල් ගෙවල් දෙරවල් වතුපිටි ස්ත්‍රී පුරුෂ දාසි දස් හා පසිඳුරනට ගොදුරු වන යම්තාක් රූප ශබ්දාදීහු වෙත් නම් සියල්ලක් ම පංචකාම වස්තු නාමයෙන් හැඳින්වේ. මේ කාම වස්තූන් කෙරෙහි ඇති ගිජුකම හෙවත් ඇලීම ක්ලේශකාම නම් වේ. එය වනාහි පවෙකි.

බෝසත්වරු මිල මුදල් ආදී පස්කම් සැපතෙහි ඇති නිසරුකම හිස්කම අවබෝධ කැරගෙන, ළැව් ගිනි හට ගත් වනයෙන් ඉවත් ව යන ඇතකු මෙන් ගිහි සම්පත් අතහැර දමා පැවිදි වෙති.

පැවිද්දනට ඇතිකම හෙවත් වස්තුව තිබීම දිළිඳුකමෙකි. නැතිකම වත්කමෙකි, හෙවත් පොහොසත්

බවෙකි. මෙසේ සලකන්නෝ මහා උදාර පුරුෂයෝ ය. දුබල පැවිද්දෝ වස්තුව රැස් කරති. උතුමෝ එය අලුයම ඉවත ලන කෙළ පිඬක් සේ පිළිකුල් කොට අතහැර දමති. සිටු සම්පත් රජ සම්පත් පවා අතහැර නිදන ව (නිර්ධන ව) වෙසෙති. සැදැහැ, සිල්, හිරි ඔතප් ආදි ගුණ රුවන් පැවිදි උතුමන්ගේ වස්තුව වේ. මිල මුදල් ආදිය නො වේ.

ගුණ රුවන් නැත්තේ දිළින්දෙකි. ශ්‍රද්ධා, ශීල, හිරි, ඔත්තප්ප, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥ ඇත්තේ මහ ධනවතෙකි. මහා භාග්‍යවන්තයෙකි. මේ ලෝකයෙහි ඉතා ම ඉහළ ම දියුණුව නම් ආධ්‍යාත්මික දියුණුව යි හෙවත් සිතේ දියුණුව යි.

**"පවිවේකජ්ඣාසයා හි බෝධිත්තා හොන්ති"** යි සඳහන් පරිදි සමාජයත් සමඟ එකට ගැටී විසීමේ ආදීනව දක්නාසුලු බෝසත්වරු විවේකයෙහි ඇලුණු සිතැත්තෝ ය. විවේකය නම් ගණය කෙරෙහි, කුලය කෙරෙහි නො ඇලී හුදෙකලාව (තනියෙම) විසීම යි. විවේකයක් නොමැති ව කිසි කලෙකත් ආධ්‍යාත්මික දියුණුවක් ලබාගත නොහැකි බව එතුමෝ දනිති.

**"නිස්සරණජ්ඣාසයා හි බෝධිසත්තා හොන්ති"** යි සඳහන් පරිදි සියලු භවයන්හි ආදීනව දක්නාසුලු බෝසත්හු සංසාරයෙහි ඇති සියලු භයානක තත්ත්වය නිසරු බව දැන සසරින් එතෙර වන අදහස් ඇත්තෝ ය. පළමුව තමන් දාන්ත ව අනුන් දමනය කරන්නටත්, තමන් ශාන්ත ව අනුන් ශාන්ත කරවන්නටත් තමන් තරණය කොට අනුන් එතෙර කරවන්නටත් තමන්

සිවුසස් (දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන සත්‍ය සතර) අවබෝධ කැරගෙන අනුනට අවබෝධ කරවන්නටත් කල්පනා කරති.

"අලෝභජ්ඣාසයා හි බෝධිසත්තා හොන්ති" යි සඳහන් පරිදි ලෝභයෙහි දෙස් දක්නාසුලු බෝසත්වරු අලෝභ අදහස් ඇත්තෝ ය. ලෝභය නම් ඇලීම යි. ආසාව යි. අලෝභය නම් පරිත්‍යාග චේතනාව යි. දන චේතනාව යි හෙවත් දෙනු කැමැත්ත යි. මේ ලෝක ධාතුවෙහි මහබෝසතාණන් වහන්සේගෙන් දන් නොලැබූවකු සොයා ගැනීම දුෂ්කර බව ධර්මයෙහි සඳහන් වේ.

අනන්තාපරිමාණ කාලයක් මුළුල්ලේ අසණයනට අනුකම්පායෙනුත් පිදිය යුතු සිල්වත් ගුණවත් උතුමනට පූජා අදහසිනුත් කෑම් බීම්, ඇඳුම් පැළැඳුම්, බෙහෙත් හේත්, යාන වාහන, ගෙවල් දෙරවල්, ඉඩම් කඩම්, ජනපද හා රාජ්‍ය පවා පරිත්‍යාග කළහ. ඇස් ඉස් මස් ලේ පමණක් නො ව, සිය දිවි පවා පිදූහ. මෙය බෝසතුන් ගත් මඟ යි.

මේ උතුම් පසළොස්වක පොහෝ ද අප මහ බෝසතාණන් වහන්සේ අනුගමනය කරන්නට ගිහි පැවිදි දෙපක්ෂය ම සිතට ගතහොත් අප හෙළ දෑයත් බුදුසමයත් රැකෙනවාට කිසි ම සැකයෙක් නැත.

**(2512 - 1968 දිනමිණ වෙසක් අතිරේකයෙනි)**



# සත්පුරුෂ ධර්ම

අපවත් වී වදාළ අග්ගමහා පණ්ඩිත වැලිගම ඤාණරතන
මහනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ විසිනි.

(පසුගිය කලබ හා සබැඳේ)

## බොහෝ ඇසූපිරූතැන් ඇති බව

මේ සිවුවන සද්ධර්මය යි හෙවත් සත්පුරුෂ ධර්මය යි. බහුස්සුතතාව යනු ද මෙයට එක් නමකි. සසර දුක් නසන්නට බලාපොරොත්තු වන්නන් විසින් ඇසිය යුතු හෙයින් ත්‍රිපිටක ධර්මය "සුත" නමි. බහුස්සුත යනු ගුරුමුඛයෙන් අසා බොහෝ ධර්මය ඉගෙන ගත් බවයි. බුද්ධකාලයේත් ඉන් මෙපිටැ ධර්මය පොත්වල ලියනතුරුත්, ධර්මය ඉගෙන ගත්තේ මුඛ පරම්පරාවෙනි. ගුරුමුඛයෙන් අසා කටපාඩම්කර ගැන්මෙනි. පෙර මුළු ත්‍රිපිටකය ම කටපාඩමෙන් ඉගෙනගත් මහතෙරවරු සිටියහ. ත්‍රිපිටකය ම කටපාඩමින් ඉගෙනීමට අදක්ෂ අය පිටක දෙකක් ද, එතරම් නොහැකි අය එක් පිටකයක් ද එතරම් වත් නො පිළිවන් අය පොත් කීපයක් ද, එසේත් නොපිළිවන් අය එක පොතක් ද යන මේ වශයෙන් කටපාඩම් කරගැනුමෙන් බහුස්සුතකම තම තමනට හැකි තරමින් ඇති කර ගත්හ. මෙසේ පෙර විසූ

භික්ෂූන් වහන්සේ මේ බුද්ධ ධර්මය කටපාඩම් කරගෙන පවත්වාගෙන ආවේ නැත්නම්, අද මේ ශාන්තධර්මය යම්තමින් වත් දැනගන්නට කාටවත් නො ලැබෙන්නේ ය. ධර්මය පොත්වලැ ලියාතැබුවායින් පසු ධර්මය කටපාඩම් කරගැනුම ක්‍රමයෙන් අඩුවන්නට පටන් ගත්තේ ය. අද වුවත් යම් කෙනෙකුන්ට තේරුම් සහිතව ධර්මය පාඩම් කර ගන්නට පිළිවන්කම තිබේ නම්, එය මහා වාසනාවකි.

සාමාන්‍යයෙන් බණපොතක් කියවා ඒ පිළිබඳ ඇති කර ගන්නා වූ හැඟුමට වඩා කටපාඩම් කරගත් ධර්මය නිසා ඇති වන ප්‍රයෝජනය කිය නොහැකි තරම් ය. තමන්ගේ ජීවිතය පිළිබඳ නොයෙක් කරදර - කම්කටොළු සහිත අවස්ථාවල දී කටපාඩම් කරගත් ධර්මය නිසා ඇතිකර ගතහැකි සංසුන් හැඟුම සැනසීම වෙන කොයිලෙසකින් වත් ඇතිකර ගත නොහැකිය. අනුන්ගේ යහපතට කටයුතු කරන පින්වතුනට වුවත් ධර්මය පාඩම් කරගැනීම කිය නොහැකි තරම් ප්‍රයෝජනය පිණිස පවතින්නේ ය.

යමෙක් ධර්මය බොහෝදුරට ම ඉගෙනගත් බහුශ්‍රැතයෙක් වූයේ ද, ඒ ධර්මයට අනුව නොපිළිපදී නම්, ඔහුගේ බණ දැනුම ප්‍රශංසාවට භාජනය වන්නේ නැත. යමෙක් බහුශ්‍රැතව වෙසෙමින් ශීලාදී ගුණදහම් පුරයි නම්, ඔහු ශීල ගුණයෙන් ද බහුශ්‍රැත ගුණයෙන් ද යන ගුණ දෙකින් ම ප්‍රශංසා ලැබිය යුත්තෙකි.

**"බහුස්සුතොපි චෙ හොති - සීලෙසු සුසමාහිතො**
**උභයෙන නං පසංසන්ති - සීලතො ච සුතෙන ච"**

යනුවෙන් ඒ කරුණ බුදුරජාණන් වහන්සේ දේශනා

කළ සේක. එබැවින් බණ ඉගෙන එයට අනුව පිළිපදිනවා නම්, ඒ දැනුම ඉතාම වටිනා එකක් බව නිතරම සිහිකළමනා ය. ආනන්ද මාහිමිපාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ අතුරින් අගතැන්පත් බහුශ්‍රැතයා ය. උන්වහන්සේට ධර්ම භාණ්ඩාගාරික ය යි කියන්නේ ඒ නිසා ය.

දිනක් එක් බ්‍රාහ්මණයෙක් බුදුරජාණන් වහන්සේ වෙත ගොස් මෙසේ ඇසුවේ ය. "ස්වාමීනි, බුදුරජාණන් වහන්ස" බුද්ධරත්නයටත් සංඝරත්නයටත් පූජාකළහැකි ක්‍රම මට වැටහෙතත් ධර්මරත්නයට පමණක් කෙසේ පූජා කළ යුතු ද යන මේ කරුණ පමණක් මට වැටහෙන්නේ නැත. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මට අනුකම්පා කොට ධර්මරත්නයට පූජාකරන සැටි දේශනාකරන සේක්වා " යි ඒ බ්‍රාහ්මණයා ඇසුවේ ය. එසේ ඇසූවිට "බ්‍රාහ්මණය" ධර්මරත්නයට පූජාකරනු කැමති නම් එක බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ කෙනෙකුන්ට පූජාකරන්නැ" යි බුදුරජාණන් වහන්සේ ඔහුට දේශනා කළසේක. එවිට ඒ බ්‍රාහ්මණයා එක බහුශ්‍රැත භික්ෂුවක් වදරන්නැ'යි කීවිට බුදුරජාණන් වහන්සේ එය භික්ෂු සංඝයාගෙන් අසන්නට ඔහුට කී සේක. භික්ෂූහු "ආනන්ද මාහිමියන් වහන්සේ බහුශ්‍රැත බැවින් අගතැන්පත් උතුමා බව" ප්‍රකාශ කළහ. සප්තාර්ය ධන අතුරෙන් සුතධනය යි කියන්නේත්, මේ බහුශ්‍රැතකම ගැනීම යි. ඔබ මේ සර්වසම්පූර්ණ වූ ප්‍රඥාගෝචර වූ ධර්මය හොඳින් ඉගෙන ගත්තොත්, බුදු දහම කෙරෙහි ඔබගේ පැහැදීම දැනට වඩා බොහෝ දියුණු වනු ඇත. බුද්ධ ධර්මයෙහි රහසෙක් නැත. කාට වුවත් නො වැටහෙන තැන් වෙතොත් ඒ ගැන ප්‍රශ්න අසා දැනගත

හැකිය. දවසට විනාඩි කිපයක්වත් ධර්මය ඉගෙනුමට ගත නොකිරීම මහා අවාසනාවක් බව නිති මෙනෙහි කළ යුත්තකි. අන් හැම ඉගෙනුමට වඩා නියම සැනසුම ලැබෙන්නේ ධර්මය ඉගෙනීමෙන් ය. එබැවින් ආගම නයින් විස්තරවන පරිදි බණ ඉගෙන නියම බහුශ්‍රැතයකු වීමට තරයේ ම අධිෂ්ඨාන කරගත යුතුය.

## පටන්ගත් වීර්ය ඇති බව

මේ පස්වැනි සත්පුරුෂ ගුණය යි. යම්කිසි යහපත් වැඩක් පටන් ගෙන එය අතරතුර පැමිණෙන බාධාවන් ගණන් නොගෙන අදහස මුදුන් පත්වනතුරු දිගටම ගෙන යෑම 'ආරද්ධ විරිය' ගුණයයි. යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම්කිසි අදහසක් සම්පූර්ණ කරගැනීමට මහන්සි ගන්නා පින්වතුනට නොයෙක් විධියේ අවහිරකම්වලටත් මූණදෙන්ට සිදුවන්නේ ය. විශේෂයෙන් ම යහපත් කටයුතුවලදී සිය සන්තානයෙන් ම පැන නැඟ එන පාපවිතර්ක බලපැවැත්ම නිසා එයට බාධා පැමිණෙන්නේ ය. තවත් කෙනෙකුන්ට පාපමිත්‍ර සේවනය නිසා යහපත් වැඩට බාධා ඇතිවන්නේ ය. මෙසේ තමන්ගේ ම සන්තානයෙන් හෝ බැහැරින් හෝ පැමිණෙන අවහිරකම් කිසිවක් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කරන්නකු තණ පතක් තරම් වත් ගණන් ගන්නේ නැත. හේ තමන් කරගෙන යන සම්මාවායාමය මඳක් වත් අඩු නො කොට දිගට ම කරගෙන යයි. බුද්ධාගමයෙහි සඳහන් වන සම්මාවායාමය යි කීවිට 1. උපන් අකුසල් නැතිකිරීමට කරන ව්‍යායාමය 2. නූපන් අකුසල් නො ඉපදීමට කරන ව්‍යායාමය 3. උපන් කුසල්

දියුණු කිරීම පිණිස කරන ව්‍යායාමය 4. නූපන් කුසල් උපදවා ගැනීමට කරන ව්‍යායාමය යි සතරාකාර වේ. මේ සතරාකාර ව්‍යායාමයා ගේ වශයෙන් යම් කෙනෙක් නිතොර වීර්ය කරත් නම්, ඔහු ආරද්ධවිරියෙහි පිහිටියෙකි.

වීර්ය කරන්නකු පළමුකොට එය නුවණින් ම කළ යුතු ය. අනුවණින් කොතරම් වීර්ය කළත් එයින් කිසි ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැත. "**පඤ්ඤානුයාතං විරියං වදන්ති - සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං**" නුවණින් කරන්නා වූ වීර්ය සියලු යහපත ලබාගැනුමට උතුම් අතක් ය යි ප්‍රකාශවන්නේ එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ දවස වැඩසිටි සෝණ තෙරුන් වහන්සේ රහත්වීම පිණිස බොහෝකල් වීර්ය කළ කෙනෙකි. උන් වහන්සේ බොහෝ කල් අධික වීර්ය කොටත් රහත් විය නො හැකි ව මෙසේ සිතූහ. "මම ආරද්ධ විරිය ගුණයෙන් යුත් ශ්‍රාවකයෙක්මි, මෙතෙක් වීර්ය කෙළෙමි නමුදු රහත්විය නොහැකි වීමි. එබැවින් මා දැන් කළ යුත්තේ සිවුරු හැර ගිහිව පින් දහම් කරගනිමින් විසීමයි." කියායි. සෝණ තෙරුන් මෙසේ සිතූ විට ඒ අදහස දැනගත් බුදුරජාණන් වහන්සේ වහා ම සෝණ තෙරුන් සමීපයට වැඩම කොට එහි පණවා තුබුණු බුද්ධාසනයෙහි වැඩ හිඳ මෙබඳු අදහසක් ඇතිවූවා නොවේ දැ" යි ඇසූ සේක.'එසේ ය, ස්වාමීනි'යි සෝණ තෙරහු පිළිතුරු දුන්හ, එවිට සෝණ තෙරුන් ගේ අධික වීර්යෙහි දෝසය පෙන්වන බුදුරජාණන් වහන්සේ 'සෝණයල ඔබ ගිහි කාලයෙහි වීණාගායනයට සමර්ථයෙක් නොවේදැ'යි ඇසූහ. 'එසේ ය ස්වාමීනි, මම ගිහි කාලයෙහි වීණාගායනයට සමත් වීමි'යි සෝණ

තෙරුන් කී විට බුදුරජාණන් වහන්සේ ඒ වීණාවේ තත් ඉතා තද නම් මිහිරිනාදය පිටවේද'යි ඇසූහ. 'නැත ස්වාමීනි' යි සෝණ තෙරණුවෝ පිළිතුරු දුන්හ. එසේ නම් වීණාවේ තත් ඉතා බුරුල් නම් මිහිරි නාදය පිටවේද' යි ඇසූහ. 'නැත ස්වාමීනි' වීණාවේ තත් ඉතා බුරුල් කළ විට ද මිහිරි හඬ නො පැතිරේය'යි සෝණ තෙරුන් කීවිට බුදුරජාණන් වහන්සේ "සෝණයල වීණාවේ තත් වැඩියත් තද වූ කල්හිත් වැඩියත් බුරුල් වූ කල්හිත් මිහිරි හඬ පිටනොවන්නාසේ ම අධික වීර්ය කරන විට ඔහු ගේ සිත උද්ධච්චයට නැමේ. ඉතා අඩු වශයෙන් වීර්ය කරන කල්හිත් සිත කුසීත භාවයට වැටේ. "**තස්මාතිහ, සෝණ, ත්වං විරියසමතං අධිට්ඨහ.**" සෝණය, ඒ නිසා ඔබ සමව වීර්ය කරව'යි අවවාද කළ සේක. ඒ අවවාදය පරිදි සමව වීර්ය කළ සෝණ තෙරණුවෝ නොබෝ කලකින් ම රහත් වූහ. "**විරියෙන දුක්ඛං අච්චේති.**" යී දෙසූ පරිදි නුවණින් කරන වීර්යයෙන් ලෞකික ලෝකෝත්තර හැම යහපත ම සලසා ගතහැකි බව නිතොර මෙනෙහි කළ යුත්තකි. එබැවින් අදහස මුදුන් පැමිණෙනවාට පළමුව කොතරම් අවහිරකම් පැමිණියත් ඒවා ගණන් නොගෙන "**වායමේථේව පුරිසෝ - යාව අත්ථස්ස නිප්ඵද**" යී දෙසූ සැටි මතක තබාගෙන අදහස මුදුන් පැමිණෙන තුරු ම වීර්ය අත්නොහරින්නට තරයේ අධිෂ්ඨාන කෙරෙත්වා.

(ලබන කලබට)



# උඩ යන්නේ බැලුන් - පාට පාට බැලුන්

වෛද්‍ය ශ්‍රියා හේමමාලී ද සොයිසා නැන්දා විසිනි.

එක්තරා ගමක බැලුන් වෙළෙන්දෙක් හිටියා. ඔහු ජීවත් වුණේ බැලුන් විකුණලා ලැබුණු ආදායමින්. හැම පාටකම බැලුන් ඔහු ළඟ තිබුණා. මේ බැලුන් විකුණලා ලැබෙන ආදායම අඩු වෙද්දි ඔහු අමුතු දෙයක් කරනවා. ඒ කාලෙට මේ තැනැත්තා හීලියම් පුරවලා බැලූම් උඩ යවනවා. පොඩි ළමයින්ට පේන්න. එතකොට පොඩි ළමයින්ට ආශාවක් ඇතිවෙනවනේ....... ඒ කියන්නේ බැලූම් වෙළෙන්දාගේ වෙළෙඳාම ඉහළ යනවා.

දවසක්, එහෙම හීලියම් පුරවපු බැලූමක් උඩගිය දවසක, එක් පොඩි ළමයෙක් ඔහු ළඟට ඇවිල්ලා, කබායෙන් අදිනවා බැලූම් වෙළෙන්දාට දැනුණා. ඒ කවුද කියලා බලන්න බැලුන් වෙළෙන්දා හැරුණම පොඩි දරුවා ඔහුගෙන් මෙහෙම ඇහැව්වා. ඔයා ළඟ තියෙන අර කළුපාට බැලූනුත් උඩ යනවා ද ?. පොඩි ළමයා හිතලා තියෙන්නේ උඩ යන්නේ පාට පාට බැලුන් විතරයි කියලා. බැලූම් වෙළෙන්දා හිනහ වෙලා, පොඩි එකාට මෙහෙම කිව්වා. උඩ යන්නේ බැලුන් වල පාට

නිසා නෙමෙයි පුතේ, බැලුම ඇතුළේ තියෙන දේ නිසා........

අපේ මේ පුංචි දුවලා පුතාලට මා මේ කතාව කිව්වේ වැදගත් වෙන්නෙ පිට පෙනුම නොවෙයි; අපි අපේ ඇතුළේ පුරවාගෙන ඉන්න දේවලින්. සිත ඇතුළේ තියෙන උතුම් ගුණදහම් වලින් තමයි අපේ වැදගත්කම වටිනාකම මැනගන්න පුළුවන් වන්නේ.

ඉතින් මේ ගැන හොඳින් හිතට අරගෙන අපි අපේ හොඳ ගුණ ධර්ම වන පරෝපකාරය, ත්‍යාගශීලි ගතිය, ඉවසීම, වීර්යය, උත්සාහය, අනතිමානීකම, කීකරුකම, ලද දෙයින් සතුටුවීම වැනි ඒවායින් හිත කය පුරවා කරගත්තොත් අපිටත් ඉහළට ම ඉහළට ම යන්න ඒකාන්තයෙන් පුළුවන් වේවී.

**ඉධ නන්දති පෙච්ච නන්දති**
**කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති**
**පුඤ්ඤං මේ කතන්ති නන්දති**
**භියෝ නන්දති සුග්ගතිං ගතෝ**

පින් කළ පුද්ගලයා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. දෙලොවෙහිම සතුටු වෙයි. මා විසින් පින් කරන ලදැයි සිතා සතුටු වෙයි. සුගතියට ගිය විට බෙහෙවින් සතුටු වෙයි.

**(ධම්මපදය, යමක වග්ගය)**



# කණ්හ ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මී පෙරේරා මහත්මනිය විසිනි.

දිනෙක දෙව්රම් වෙහෙර දම් සභාවට රැස්වූ භික්ෂූන් වහන්සේලා අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අසම සම ගුණ මෙන් ම උන්වහන්සේ ගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳ කතා කරමින් සිටිය හ. 'අප භාග්‍යවතුන් වහන්සේට ඉහළින් ප්‍රාතිහාර්ය පෑමට කිසිම සමතෙක් නොමැති බව ඔබ නොදන්නෙහිද'යි එක් භික්ෂුවක් විමසූහ.

එය සත්‍යයකි. මක්ඛලීගෝසාල වැනි ශාස්තෘවරුන්ටත් ප්‍රාතිහාර්යයන් පෑමට නොහැකි වූවා නොවේද'යි අනෙක් භික්ෂුවක් පැවසූහ. මෙම කතාව පිළිබඳ දැනුවත් වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ප්‍රාතිහාර්යයන් පිළිබඳවත් විශේෂයෙන් යමා මහ පෙළහර මුල්කොට කණ්හ ජාතකය දෙසූ සේක. ඒ පෙර කල තම මෑණියන්ට සැලකීම සඳහා ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව ගවයකු විසින් පෑ වික්‍රමය පිළිබඳ ජාතක කථාවයි.

ඈත අතීතයේ බඹදත් රජ කල අප මහ බෝසතාණෝ ගව ජාතියක උපත ලදහ. අඟ හිඟකම් පිරි ජීවිතයක් ගත

කළ එක් තැනැත්තියක් හැකි ලෙස මේ වසු පැටියාට කවා පොවා, "ආර්යක කාල" ලෙස නම් තබා, තම පුතෙකු ලෙස හදා වඩා ගත්තාය. ආර්යක කාල යහපත් ගතිගුණ ඇති වසු පැටවෙක් විය. ගම්වැසියෝ වසු පැටවාට ආදරය කළහ.

තරුණ වියට පත් ආර්යක කාල තම මෑණියන් ජීවත්වීමට දරන වෑයම දැක කෙසේ හෝ ඇය දුප්පත් බවින් මුදවා ගත යුතු යැයි අදිටන් කරගත්හ. මේ බෝසත් ගවයා, තමාට සරිලන මෙහෙවරක් සෙවූ මුත් කිසිදු ගම්වැසියකු ඔහු වැඩෙහි යෙදවූයේ නැත. නමුත් ආර්යක කාල තම අධිෂ්ඨානය අත් නොහැර. හී සෑම, දර ඇදීම, වැන්නක නිරත විය හැකි දැයි සොයා බැලූහ. ගැල් නායකයකුගේ ගැල් පන්සියයක් මඩෙහි එරී ඇති නිසා, තම ගවයන් යොදා ගොඩට ඇදීමට තැත් කළත්, එය ව්‍යර්ථ වන අයුරු ආර්යක කාල බලා සිටියහ.

ඔහු දුටු ගැල්නායකයා, "මේ ගවයාට ගවයන් පන්සියයක ගේ වීර්යය ඇති බව පෙනේ. මොහු ලවා මගේ ගැල ගොඩට ඇදිය හැකි නොවේදැ'යි සිතුවේය. වට පිට බැලූ ගැල්නායකයා, ආර්යක කාල ගේ ස්වාමියෙකු නොදුටු බැවින් නාස් ලණුවෙන් ඇද්දේය. බෝසත් ගවයා නොසෙල්වී සිටියහ. කහවනු දහසකට ගැල් පන්සියය ගොඩට අදින ලෙස ගවයාගෙන් ඉල්ලා සිටියේය. තම මව දුප්පත් කමින් මුදවා ගැනීමට හැකිවේයැයි සිතූ ආර්යක කාල අධිෂ්ඨානයෙන් යුතුව, සිතෙහි මෙන්ම ගතෙහි වීර්යය එක්තැන් කොට ගැල් පන්සියය ගොඩට ඇද්දේය. ගම්වැසියෝ මේ කිනම් ප්‍රාතිහාර්යක් දැයි සිතූහ.

ලොබ වූ සිතින්, ගැල්නායකයා කහවණු පන්සියයකින් යුත් පොට්ටනියක් ගවයාගේ කරෙහි බැන්දේය. මෙය දැනගත් ගවයා ගැල් පන්සියයට යෑමට නොහැකි ලෙස මඟ අවුරා නොසෙල්වී සිටියේ ය.

තම වරද වටහාගත් ගැල්නායක, තවත් කහවණු පන්සියයක් එක්කර කරෙහි බැන්දේ ය. එවිට ඉතා වෙහෙසට පත්වී සිටිමුත්, දිව ගොස් මෑණියනට කහවණු දහස ලබාදුන් ආර්යක කාල දුටු මව මෙපමණ වෙහෙසවීමට සිදුවූ කරුණ ගම්වැසියන්ගෙන් දැනගත්තා ය. තම පුතු උණු පැණින් නාවා, කවා පොවා සුවපත් කළා ය. එතැන් පටන් දෙදෙන සතුටින් සැපවත් ජීවිත ගත කළහ. මෑණියෝ තම ආයුෂ අවසන්ව කර්මානුරූපීව මියගියා ය.

එකල බෝසතාණන් ලෙසින් මෙන්ම මෙකල බුදුරජාණන් වහන්සේ ලෙස අධිෂ්ඨාන බලයෙන් යමා මහ පෙරහර වැනි අසමාන ධූර දරනා බැව් පහද දුන් සේක.

ආර්යක කාලක ගවයා එකල තමන් වහන්සේ බවත්, මෑණියෝ උප්පලවණ්ණා මෙහෙණින් වහන්සේ බවත් වදාළ සේක.



# ඉතින් සැනසෙනු දියණියේ....

# කළණ මිතුරෝ...

මිනිසත් බව කියන උතුම් වරය ලැබෙන්නෙ කෙනෙකුට බොහෝ කාලයකට පසුවයි. මේ ඉමක් කොනක් නොපෙනෙන සසර ගමනේදී අප කොතැන කොහොම මොන විදිහට ගත කළාද කියා කියන්නට සමත් කෙනෙක් තුන් ලෝකයේම නැහැ. ඒත් කලාතුරකින් වගේ විස්මිත අවබෝධයක් ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලොව පහළ වුණහම ඒ අනන්ත සසරක තතු විස්තර අපට පෙන්වා දෙන්නේ මහාකරුණාවෙන්ම යි. "පින්වත් මහණෙනි, මේ සසර ගමන තුළ අසුරු සැණක් ගහණ තරම් සුළු කාලයක වත් යම් සැපයක් නම් නැහැ." හය හතර තෝරා ගත හැකි වයසේ සිට, කෙනෙක් තමන්ගේ ජීවිතය ගැන තරමක් හෝ අවබෝධයෙන් බලන්නට පුරුදු වුවහොත් මේ බව තම තමන්ටම පැහැදිළිවනු ඇත.

ඉන්ද්‍රියන් මුහුකුරා යන විට ඔබ මේ සත්‍ය වසන් කරන්නටත් ඒ දෙස නොබලා සිටින්නටත් පුරුදු වන්නේ මෙහි ඇති කටුක දුක් සොබාවය දකිනු අකමැති නිසාවෙන්ම ය. ඉන් පසු විසිතුරු බාහිර ලොවකින් සතුට සොයන ඔබ රූ දසුන්, හඬ රටා, ගඳ සුවඳ, රස, පහස සොයමින් නොලැබෙන සතුටක් පසුපස හැල්මේ ගමන් කරන්නේ මහත් වීර්යයෙනි. එහෙත් අවසානයේ දී ඔබට උරුම වන්නේ ඔබ කිසි විටෙකත් දකින්නට

හෝ අසන්නට අකමැති වූ වේදනාත්මක මතකයන් කිහිපයකි. භෞතිකව ඔබ නොයෙක් දේ ලබා ගන්නට සමත් වුවත් එය ඔබ ලද සැබෑ දියුණුවක් නම් නොවන්නේ ම ය. මේ සසර පුරා ඔබ ඔය ලෙසින් ලෞකිකව සුවපත් වූ වාර අනන්තය ය. එහෙත් තවම දුක් ඇති සසර තුළ ඔබ සැරිසරන කෙනෙක් බව මතක තබා ගන්න. අපට අද මේ වගේ අවබෝධයක් අපේ ජීවිත දෙස බලා ම තේරුම් කරගන්නට හැකි වුණේ බුදුදහමේ ඇති අකාලික බව නිසාවෙන් ම යි. බුදු සසුනක් නොමැති කාලයන්හි සත්වයෝ කෙසේ නම් මෙ වැනි අවබෝධයක් ජීවිතය තුළින් දැකගන්න ද?

අකාලික බුදු දහම තුළින් ඇති කරන්නා සැබෑ නුවණින් මේ දුක් ඇති සසරින් මිදෙන්නට තවම ඉඩ හසර ලොව පවතින බැව් ඔබට ම පසක් වේවා. ඒ සදහම් මඟ වඩින්නටත්, බුදු සසුනක සුන්දර අසිරිය මිහිපිට ම මේ අත් බැව්හිදී ම අත්විඳින්නටත් හැකිවේවා....... මහා සාගරයේ රළ ගෙඩි වගේ ඔබව යටකරගෙන යන මේ ඉපදීමෙනුත් ජරාවට පත්වීමෙනුත් එතෙර වන්නට ගෞතම සම්බුදු සසුනේ අසිරිමත් පිළිවෙතින් නිවී සැනසුන සුන්දර හදවතක අසිරිමත් වදන් පෙළ, පිණැති දියණියේ ඔබහට පිටුබලයක් වේවා! උපකාරයක් වේවා!

මේ වනාහි අම්බපාලී රහත් තෙරණිය ගේ ථේරී ගාථා පෙළ යි....

ඉස්සර තරුණ කාලේ නම් නිල් පාට මී මැස්සන්ගේ පාටට සමාන, කැරලි ගැසුණු මගේ කොණ්ඩය බොහෝ ම සිනිඳුයි. එහෙත් ඒ කෙස් දැන් සුදු පාට හණ නූල් වගේ ජරාවට පත්වෙලා. සදහම් ඇස් ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වන්නේ ම ය. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන්නේ ම ය.

ඒ යොවුන් වයසෙ දී මම මගේ කොණ්ඩය මල් වලින් සරසා ගන්නවා. එතකොට මේ කෙස් කලඹ මනහර සුවඳින් පිරී ගිය කරඬුවක් වගෙයි. එහෙත් පෙර තිබූ ඒ සොඳුරු බව අද දකින්නට

නම් නැහැ. මේ කෙස් දැන් ජරාවට පත් වෙලා හැමවිටම දුගඳින් වසාගෙන. සැබෑ විය සම්බුදුරජාණන් වහන්සේ ගේ අසිරිමත් බුදු වදන. කිසිඳු වෙන අයුරකින් නම් නො ම විය.

බොහොම පිළිවෙලකට සකස් කරල තියෙන සොඳුරු උයනක් වගේ මම මගේ කොණ්ඩය පනාවක් අරගෙන පීරලා අවුල් හැරලා සකස් කරනවා. රත්තරනින් හදපු කටු අරගෙන ඒ සකස් කරපු කොණ්ඩයේ ගසා අලංකාර කරනවා. ඒ වුණත් අද ඒ කොණ්ඩය ගැලවිලා ගිහින්. කෙස් ගස් ටිකක් විතරක් තැනින් තැනින් ඉතිරි වෙලා තිබෙනවා. දැන් මට වැටහෙනවා සදහම් ඇස් ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බව.

හොඳට පීරලා සකස් කරන කෙස් වැටිය මම ගොතන්නටත් පුරුදු වෙලා හිටියා. එහෙම ගොතපු කෙස් කලඹ තමයි රන් ආභරණ වලින් සැරසුවේ. ජරාවට පත් වීම නම් ධර්මතාවය දැන් ඒ කලු කෙස් වැටිය වසාගෙන. කලු කෙස් සුදු පැහැයට හැරිලා තිබෙනවා දුටු විට මට වැටහුනා සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බව.

බොහෝ ම දක්ෂ සිත්තරෙක් නිල් පාටින් සීරු මාරුවට ඇඳපු ඉරි දෙකක් වගේ මගේ ඇහි බැමි දෙක ඉස්සර හරිම ලස්සනයි. ඒ තරුණ වයස දැන් ගෙවී ගිහින් නිසා නළලේ රැලි වලින් එල්ලා සිටිනවා වගේ ඒ ඇහි බැමි කඩා හැලෙනවා. ජරාවට පත් වෙන හැටි ගැන සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව මම දැනගත්තා. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බවත් මට වැටහුණා.

නිල් පාට මැණික් දෙකක් වගේ පැහැසරින් බැබළුනු මගේ දික් වූ ඒ ඇස් දෙක ඉස්සර නම් හැමදෙනාගේ ම සිත් ඇද

ගන්නට සමත් වුණා. ඒත් දැන් ජරාවට පත් වීම නම් ලෝක ස්වභාවය, ඒ ඇස් දෙකේ පෙර තිබුණු ඒ සොඳුරු බව විරූපී කර ඇති බව මම දුටුවා. එවිට මම සැබැවින් ම වටහාගත්තෙ මේ කරුණ යි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බවත් කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බවත් පමණයි.

යොවුන් වයසේ දී මුහුණේ නැහැය, 'දෙඇස්, කට, නළල' ට අනුරූප වෙන විදිහට ම මැනැවින් මැදින් උස් ව පිහිටලා තබුණා, නමුත් කාලය ගෙවී ගොස් මහලු විය එළැඹිලා ඒ සිනිඳුවට උස්වට තිබුණු නැහැය දැන් හකුළුවලා දමලා පෙර තිබුණු සොඳුරු බව ගිලිහිලා ගිහින්. සදහම් ඇස් ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වන බව වැටහුණා. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බවත් හොඳින් තේරුම් ගත්තා.

රත්තරන් අරගෙන හොඳට මැදලා පිරියම් කරල වටකුරුව සකස් කරන ලද වළලු දෙකක් වගේ මගේ දෙකන් පෙති ඉස්සර නම් බොහෝ ම ලස්සනයි. ජරාව පත් වීම මට අද උරුම කර දුන්නේ එල්ලා වැටෙන විරූපී වූ දෙකන් පෙති පමණයි. මට වැටහුණා සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බව.

සුදෝ සුදු පාටින් බබළන කොඳ මල් කැකුළු වගේ ලස්සන දත් පෙළක් මට ඉස්සර ලැබිලා තිබුණා. ඒත් ජරාවට පත් වුණු ඒ දත් පෙළ අද දකින්නට ලැබෙන්නේ කහ පාටින්. ඒ වගේම ඒ දත් පෙළ සමව දැන් නැහැ. ඇත්තේ තැනින් තැන කැඩුණු සිදුරු වුණු බිඳී ගිය හැලී ගිය දත් ටිකක්. මහලු වීම මට උරුම කර දුන්නේ මෙය පමණයි. ඉතින් මම වටහා ගත්තා සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බව.

සුන්දර වනයක තුරු ලතාවලින් පිරුණු මලින් ගැවසී ගත් වන ලැහැබක සතුටින් හැසිරෙන ඉතා මිහිරි ස්වරයෙන් ගී ගයන කෝකිලාවියක් වගේ මම ඉස්සර ජීවිත් වුණේ. එතරම්ම මිහිරි හඬක් මට ලැබිලා තිබුණා. එහෙත් දැන් වයස මුහුකුරා ගිහින් කාලය ඉක්මිලා ගිහින්. ජරාව මා වසාගෙන පෙර තිබූ මිහිරි කට හඬ වෙනුවට දැන් මා සතුව ඇත්තේ හැමවිටම පැකිලෙන මහ බයාදු දුබල හඬක්. ඉතින් මම දැනගත්තා මේ ලොව යමක් සත්‍ය නම් ඒ බුදු වදන ම බව. සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සිදු වෙන බව. කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බව.

රනින් සාදවා හොඳින් ඔප දැමූ හක් ගෙඩියක් වගේ වටකුරු වූ සියුමැලි වූ පිරිපුන් වූ ගෙලක් ලබන්නට මම වාසනාවන්ත වුණා. ජරාවට පත්වීම මොනතරම් වෙනසක් සුන්දර ව තිබූ මගේ බෙල්ලට සිදු කරලා ද. දැන් එය රැලි ගැහිලා වකුටු වෙලා නහර ඉලිප්පිලා නැමිලා ගිහින්. මම සැබැවින් ම වටහාගත්තෙ මේ කරුණ යි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සැබැවින් ම සිදු වෙන බවත් කිසි විටෙකවත් එවා වෙනයම් අයුරකින් නොවන බවත් පමණයි.

පෙර මාගේ බාහු දෙක මොනතරම් ශෝභමානදැයි වචනවලින් පවසනවා නම්, හොඳින් වට වුණු දෙර පොලුවලට ඒ දෙබාහු උපමා කරන්න පුළුවන්. ඒත් හැම අතින් ම පැළුණු පළොල් පත්තක් වගේ ඒ පිරිපුන් දෙබාහු දැන් ජරාවට පත්වෙලා. සත්‍යවාදී වූ බුදු වදන එලෙසින් ම ලොව සිදු වන බව මම හොඳින් ම වටහා ගත්තා.

පෙර සොඳුරු ලෙසින් සිනිඳුව තිබූ මගේ අත් ලස්සන ආභරණවලින් තව තවත් විසිතුරු වුණා. රනින් කරන ලද නොයෙක් වූ ඒ ආභරණ නිසා මගේ දැත් මෙන් ම ඇඟිලිත් හැමවිට ම බැබළෙමින් තිබුණා. ජරාවෙන් මිරිකිලා ගිය මගේ දෙඅත් වගේම ඇඟිලිත් දැන් පෙනෙන්නේ සාරයක් නැති ව

වියලුණු ඇඹුල් අල (රාබු අල) ගොඩක් වගේ අවලස්සනවයි. ඒ නිසා සත්‍යවාදී වූ බුදු වදන එලෙසින් ම ලොව සිදු වන බව මම හොඳින් ම වටහා ගත්තා.

ඉස්සර මගේ පියයුරු දෙක පිරිපුන්ව හොඳින් පිහිටලා තිබුණා. එහෙත් වයසට යෑමෙන් පසු දැන් ඒ පියයුරු වතුර හිඳිච්ච පෙරහන්කඩ දෙකක් වගේ පහළට එල්ලා වැටෙනවා. ජරාවට පත් වීම ගැන සම්බුදුරජාණන් වහහසේ යම් දෙයක් පවසා තිබෙනවා ද එය එසේ නොවනවා කියා කියන්නට කිසිවෙකුට හැකිවෙන්නේ නැහැ. ඒ බුදු වදන සැබෑ ලෙසින් ම මේ ලොව සත්‍යක් මිස අසත්‍යයක් නම් නොවෙයි.

තරුණ වයසේදී මගේ කය රත්තරනින් සාදවා හොඳින් ඔප මට්ටම් කරන ලද පුවරුවක් වගේ සුන්දර ව බැබළුණා. එහෙත් දැන් ඒ කය ජරාවට පත් වෙලා ඇඟ පුරාම ඇති හම එල්ලා වැටෙනවා. එය දුටු විටත් කෙනෙක් තුළ දැන් ඇති වෙන්නේ පිළිකුලක් ම යි. බුදු සමිඳුන් ගේ විස්මිත අවබෝධය නම් මහා පුදුමයක් ම යි. යම් දෙයක් පිළිබඳව යම් වචනයක් සම්බුදු මුවින් පවසා ඇති නම් සැබැවින් ම ඒ වචනය මේ ලොවේ සත්‍යක් වන්නේ ම ය. එය අන් ලෙසකින් සිදු නොවන්නේ ම ය.

ඉස්සර මගේ කකුල්වල කළවා දෙක හොඳට වැඩුණු ඇතෙකුගේ හොඬ යම් සේ ද එලෙසින් පිරිපුන් ව වැඩී තිබුණා. එහෙත් තරුණ වයස ගෙවී ගොස් මහලු විය එළැඹිලා. ඒ කළවා දැන් උණ බට දෙකක් වගේ අවලස්සන වෙලා. මම සැබැවින් ම වටහාගත්තෙ මේ කරුණ යි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් දෙයක් පවසා ඇත් ද ඒවා එලෙසින් ම සැබැවින් ම සිදු වෙන බවත් කිසි විටෙකවත් ඒවා වෙනයම් අයුරකින් නොවන බවත් පමණයි.

ඉස්සර මාගේ කෙණ්ඩා දෙක රනින් සාදවා ඇති මටසිලුටු නූපුර වලින් සැරසුවාම බොහෝම ලස්සනට බැබළුණා. එහෙත් එද එලෙසින් තිබුණු කෙණ්ඩා දෙක අද තලපිති දෙකක් වගේ

ජරාවට පත් වෙලා. යම් දෙයක් පිළිබඳව යම් වචනයක් සම්බුදු මුවින් පවසා ඇති නම් සැබැවින් ම ඒ වචනය මේ ලොවේ සත්‍යක් වන්නේ ම ය. එය අන් ලෙසකින් සිදු නොවන්නේ ම ය. මේ කරුණ හොඳින් මා වටහා ගත්තා.

සිනිඳු හිඹුල් පුළුන් පුරවලා වගේ ඉස්සර මගේ දෙපා තිබුණේ. නමුත් ඉස්සර පිරිපුන්ව සිනිඳුවට තිබුණු මේ දෙපා අද ජරාවට පත්වෙලා. යටි පතුල් පැළිලා. හම රැලි වැටිලා. ඉතින් ජරාවට පත්වීම ගැන සඳහන් කර ඇති සත්‍යවාදී වූ ඒ බුදු වදන එලෙසින් ම ලොව සිදු වන බව මම හොඳින් ම වටහා ගත්තා.

මේ ශරීරයේ ඇත්ත තත්ත්වය ඔන්න ඔය විදිහට තමයි මට වැටහුණේ. පෙර බොහෝ පිරිසකගේ අවධානයට ලක් වුණු සුන්දර සිරුරක් තිබුණ මට මේ මහලු වීම උරුම කර දුන්නේ අවලස්සන විරූපී පෙනුමක් විතරයි. මා දිහා බලන හැම කෙනෙක් තුළම උපදින්නේ පිළිකුලක් විතරයි. දූන් දූන් මේ කයේ නොඑක් රෝග ආබාධ හටගන්නවා. දවසින් දවස ඒවායේ ස්වභාවය එන්න එන්නම දරුණු වෙනවා. මැටි ආලේප කරලා තිබුණ ගෙදරක ඒ මැටි ආලේප දියවෙලා ගිහින් වරිච්චි බිත්තිවල තිබුණු මැටි බදමත් ගැලවිලා ගිහින් බිමට වැටෙන්නට සූදනම්ව තිබෙන්නේ මොන විදිහට ද, ජරාවට පත් වුණු මගේ කයත් ඒ වගේම යි. බුදු සමිඳුන් ගේ විස්මිත අවබෝධය නම් මහා පුදුමයක් ම යි. යම් දෙයක් පිළිබඳව යම් වචනයක් සම්බුදු මුවින් පවසා ඇති නම් සැබැවින් ම ඒ වචනය මේ ලොවේ සත්‍යක් වන්නේ ම ය. එය අන් ලෙසකින් සිදු නොවන්නේ ම ය.

එදා දඹදිව විසූ මේ සුරූපී කාන්තාව තම ශරීරය ගැන කිසි විටෙකත් නොසිතූ අන්දමට සැබෑ තතු දැක ගත්තේ ගෞතම බුදු සසුනේ ඇති අකාලික බව නිසාවෙන් ම ය. ගිහිකල යොවුන් වයසේ දී රුවේ ඇති ලස්සන නිසාවෙන් මෝ තොමෝ රැකියාවෙන් ගණිකාවක් වූවා ය. එහෙත් සසර මහා පින් බලයකින් ඇයට සත්‍යවාදී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ

ගේ ඒ විස්මිත අවබෝධයෙන් ලද ලොව සැබෑ තතු දැන ගන්නට හැකි වුණා. කොතරම් ආසාවෙන් රැකගෙන සිටිය ද හේතු ප්‍රත්‍යයන්ගෙන් සැකැසුණු යම් දෙයක් ලොව ඇති ද ඒ හේතු විනාශ වී යෑමෙන් ඒ සියලු දේ විනාශයට පත් වන බව ඇය ද වටහාගත්තා ය. සම්බුදු සසුනේ පැවිද්ද ලබන්නට මෙතුමිය වාසනාවන්ත වුණා. පැවිදි ව නොබෝ කලකින් ඉපදෙමින් මැරෙමින් අතරක් නොමැතිව යන සංසාර ගමන නතර කරන්නට ද මේ උත්තමාවියට හැකි වුණා. මේ උතුම් තෙරණිය ගේ ථේරී ගාථාවන් ජීවිතයේ සැබෑ තතු විවර කරගන්නට උපකාර වේවා. මේ අවවාදය ඔබේ දිවියට කමටහනක් වේවා.

යොබ්බන මදය නිසා තරුණ කාලේ ගෙවිලා යනවා. ජීවිත මදය නිසා මැදි වයසත් නොදැනීම ගෙවිලා යනවා. ආරෝග්‍ය මදය එනකොට ඔබ තවත් වයසට ගිහින්. ඇත්ත දැක දැකත් ඒවා වසන් කරන්නට ම තමයි හිත නැමෙන්නේ. බලන්න අවිද්‍යාවක රැවටීම. පින්වත් ඔබ තරුණ කාලේදීම ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් සරණ යන්න. ඒ අකාලික මුණි දහමෙහි වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ නිති හැසිරෙන්න. ලොවේ අනුත්තර පින් කෙත වූ උතුම් ශ්‍රාවක සංඝරත්නයෙහි ආශිර්වාදයන් මැද සොඳුරු පිළිවෙතෙහි රැඳෙන්නට කාලය මේ බැව් වටහා ගන්න. දුර්ලභව අපට ලැබුණ මේ අවස්ථාව බොහෝ ම කලාතුරකින් හිමිවන දෙයක් බව හොඳින් තේරුම් ගන්න.

මහලු වීම, ජරාවට පත් වීම පින්වත් ඔබව ඉක්මවා යන්න කලින් ඔබත් ජීවිතයේ සැබෑ තතු අවබෝධයෙන් දැන මේ ගෞතම බුදු සසුනේ පිහිට ලබන්නට උත්සාහවත් වන්න. ශ්‍රී ලාංකීය කාන්තාවට ලොව උතුම්ම දායාදය ලැබුණු මේ උඳුවප් පොහෝ දිනයේ දී පිළිවෙතින් පෙළ ගැසෙන්නට ඔබත් අදිටන් කරගන්න. ඔබට අම්බපාලී මහරහත් තෙරණියගේ ආශිර්වාදය ම වේවා..!